පුනාහරි ප්‍රාදේශිය සභාව

කිලිනොච්චි දිස්ත්‍රික්කය

-------------------------------------------

1. මූල්‍ය ප්‍රකාශ

-------------------

1.1 මූල්‍ය ප්‍රකාශ ඉදිරිපත් කිරිම

---------------------------------

සමාලෝචිත වර්ෂය සඳහා වු මූල්‍ය ප්‍රකාශ 2014 ජුලි 07 දින විගණනය සඳහා ඉදිරිපත් කරන ලද අතර ඉකුත් වර්ෂය සඳහා වු මූල්‍ය ප්‍රකාශ 2013 මාර්තු 28 දින ඉදිරිපත් කරන ලදි. සමාලෝචිත වර්ෂය සඳහා වු විගණකාධිපතිවරයාගේ වාර්තාව 2014 දෙසැම්බර් 15 දින සභාවේ සභාපතිවරයා වෙත ඉදිරිපත් කරන ලදි.

1.2 මතය

-------------

මෙම වාර්තාවේ 1.3 ඡේදයෙහි සඳහන් කරුණු වලින් වන බලපෑම් හැර මූල්‍ය ප්‍රකාශන වලින් 2013 දෙසැම්බර් 31 දිනට පුනාහරි ප්‍රාදේශිය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වු මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශ පිළිබඳ අදහස් දැක්වීම්

-----------------------------------------

1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

----------------------------

මූල්‍ය ප්‍රකාශයන්හි නිරික්ෂණය වු ගිණුම්කරණ අඩුපාඩු පහත වගුවෙහි වියදම්, ආදායම් සහ වත්කම් යටතෙහි දක්වා ඇත.

| මූල්‍ය ප්‍රකාශ කෙරෙහි බලපෑම | වියදම් | | ආදායම් | | වත්කම් | |
|---|---|---|---|---|---|---|
| | අවස්ථා සංඛ්‍යාව | වටිනාකම | අවස්ථා සංඛ්‍යාව | වටිනාකම | අවස්ථා සංඛ්‍යාව | වටිනාකම |
| | | රු. | | රු. | | රු. |
| වැඩියෙන් දැක්වීම් | 01 | 415,000 | 02 | 44,103 | 01 | 5,590,000 |

1.3.2 විගණනය සඳහා සාක්ෂි නොවීම

-------------------------------------

අවශ්‍ය සාක්ෂි ඉදිරිපත් නොකිරීම නිසා වටිනාකම රු.170,021 ක් වූ ගනුදෙනු 18 ක් විගණනයේදී සන්නිරික්ෂණය කිරීමට නොහැකි විය.

2. මූල්‍ය සහ මෙහෙයුම් සමාලෝචනය

-------------------------------------------

2.1 මූල්‍ය ප්‍රතිඵල

----------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශ අනුව සමාලෝචිත වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම් අතිරික්තය රු.2,801,862 ක් වූ අතර එයට අනුරූපව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම් අතිරික්තය රු.1,433,801 ක් විය.

2.2 මූල්‍ය පාලනය

--------------------

අයවැය ලේඛනය නිසි පරිදි පිළියෙල කර නොතිබූ බැවින් අයවැයගත සහ තථ්‍ය ආදායම අතර රු.5,602,113 ක් වූ වෙනසක් සහ අයවැයගත සහ තථ්‍ය වියදම අතර රු.2,904,341 ක් වූ වෙනසක් විගණනයේදී නිරික්ෂණය විය.

2.3 ආදායම් පරිපාලනය

2.3.1 ඇස්තමේන්තුගත ආදායම තථ්‍ය ආදායම සහ හිඟ ආදායම

සභාපතිවරයා විසින් ඉදිරිපත් කරන ලද පරිදි ඇස්තමේන්තුගත ආදායම, තථ්‍ය ආදායම සහ හිඟ ආදායම පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් විෂයය | ඇස්තමේන්තුගත | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|
| | රු.000 | රු.000 | රු.000 |
| වරිපනම් සහ බදු | - | 193 | - |
| බදු කුලී | 2,143 | 2,005 | - |
| බලපත්‍ර ගාස්තු | 602 | 455 | - |
| වෙනත් ආදායම් | 15,985 | 21,679 | 3,305 |
| | 18,730 | 24,332 | 3,305 |

2.3.2 ආදායම් අහිමිවීම

සභා සීමාව තුල වූ දේපළ තක්සේරු නොකිරීම නිසා සභාවට එහි ආදායම් අහිමි වී තිබුණි.

2.3.3 මුද්දර ගාස්තු

i. 2013 ජනවාරි සිට දෙසැම්බර් දක්වා වූ කාල පරිච්ඡේදය සඳහා අයවිය යුතු රු.915,670 ක් වූ මුද්දර ගාස්තු අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

ii. 2010-2012 දක්වා වූ කාලපරිච්ඡේදය සඳහා මුද්දර ගාස්තු ලෙස රු.1,168,864 ක් ගිණුම් ගතකර තිබුණු නමුත් එම මුදල් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

2.3.4 ආදායම් අයකර නොගැනිම

-----------------------------------

මෙම වාර්තාවේ දින දක්වාත් රු.333,264 ක් වු ආදායම් ණයගැතියන් අයකරගත යුතුව පැවතුණි.

2.3.5 සන්නිවේදන කුළුණු ගාස්තු

-------------------------------

අංක 1597/8 සහ 2009 අප්‍රේල් 17 දින දරන අති විශේෂ ගැසට් පත්‍රය ප්‍රකාරව සහා බල ප්‍රදේශය තුල ඇති සන්නිවේදන කුළුණු සඳහා අයවිය යුතු පහත සඳහන් ගාස්තු අයකර ගැනිමට කටයුතු කර නොතිබුණි.

i. සංවර්ධන බලපත්‍ර
ii. ප්‍රාථමික සැලසුම්
iii. අනුකූලතා සහතික
iv. ආවරණ අනුමැතිය

2.4 අනුකූල නොවීම්

---------------------

නීති, රිති සහ රෙගුලාසි වලට අනුකූල නොවිමේ පහත සඳහන් අවස්ථා විගණනයේදි නිරික්ෂණය විය.

| නීති, රීති, සහ රෙගුලාසි වලට යොමුව | | අනුකූල නොවිම |
|---|---|---|
| (අ) ප්‍රාදේශීය සභා (මුල්‍ය සහ පරිපාලන) රීති - 1988 | | |
| V පරිච්ඡේදයේ 140 වගන්තිය | - | සභාපතිවරයා වෙත රු.25,000 ක අත්තිකාරමක් ලබා දි තිබුණු අතර අත්තිකාරම ලබා ගැනිමට හේතු කිසිවක් සභාපතිවරයා ඉදිරිපත් කර නොතිබුණි. මෙය මෙම වාර්තාවේ දින දක්වා අයකර නොතිබුණි. |

(ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදි ජනරජයේ මුදල් රෙගුලාසි

-------------------------------------

(i) අංක 189 - 2012 ජුනි 13 දින ආරක්ෂක තැන්පතුවක් ලෙස ලබාගෙන තිබූ රු.66,670 ක් වූ චෙක්පත අගරු වී තිබුණි. සභාව මේ සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි.

(ii) අංක 571 - වර්ෂ 2 කට වඩා පැරණි රු.1,257,649 ක් වූ කල් ඉකුත් වූ චෙක්පත් සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුනි.

(ඇ) රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ අංක 41/90 සහ 1990 ඔක්තෝබර් 10 දින දරනු චක්‍රලේඛය - සභාවේ වාහන වල ඉන්ධන පරිභෝජනය පරික්ෂා කර නොතිබුණි.

(ඇ) අංක 1ඒ1/2002/02 සහ 2002 නොවැම්බර් 28 දින දරන භාණ්ඩාගාර චක්‍රලේඛය - චක්‍රලේඛයේ නියමිත පරිදි පරිගණක සහ උපාංග සඳහා ලේඛණ නඩත්තු කර නොතිබුණි.

(ඉ) මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයේ ලේකම්ගේ අංක: ඩීඑම්ඒ/2009/(1) සහ 2009 ජුනි 9 දරන විගණන සහ කළමනාකරණ චක්‍රලේඛය - සමාලෝචිත වර්ෂය තුල රැස්වීම් 04 ක් පැවැත්විය යුතු නමුත් එසේ රැස්වීම් පවත්වා නොතිබුණි.

2.5 වත්කම් කළමනාකරණය

-------------------------------

2.5.1 වාහන වල අයිතිය මාරු කිරිම

-----------------------------------

සභාවට පරිත්‍යාග කරන ලද වාහන 14 ක අයිතිය මාරු කිරිමට සභාව කටයුතු කර නොතිබුණි.

2.6 කළමනාකරණ දුර්වලතා

------------------------------

කාර්ය මණ්ඩලයේ පුරප්පාඩු 31 ක් පැවතිම හේතුවෙන් සභාවේ සංවර්ධන සැලසුම් වලට බලපෑම් ඇති වී තිබුණු අතර සභාව මේ සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි.

2.7 ක්‍රියාත්මක නොකළ සැලසුම්

-----------------------------------

රු.361,186 ක් වූ පරිත්‍යාග ප්‍රදේශයේ අදාළ ප්‍රජා මධ්‍යස්ථානයන්ට ලබාදීමට කටයුතු කර නොතිබුණි.

2.8 අනුමැතිය රහිත වියදම්

---------------------------

ළමයින්ගේ පෝෂණය සහ ආපදා කළමනාකරණ සේවා සඳහා කිරි ආහාර මිළදී ගැනිම සඳහා දරන ලද රු.415,000 ක වියදම සඳහා ප්‍රාදේශිය සභා පණතේ 132(එෆ්) වගන්තිය ප්‍රකාරව අමාත්‍යවරයාගේ අනුමැතිය ලබාගෙන නොතිබුණි.

2.9 අභ්‍යන්තර විගණනය

--------------------------

ප්‍රාදේශිය සභාවේ අභ්‍යන්තර විගණන ඒකකයක් නොපැවතුණි.

2.10 ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය

------------------------------------

කාබනික පොහොර නිෂ්පාදන ක්‍රමයක් ක්‍රියාත්මක කර නොතිබුණු අතර එකතු කරන ලද කැළි කසල ගිනි තබා හෝ පස්යට කර වල දමා හෝ තිබුණි.

3. පද්ධති සහ පාලන

-----------------------

පහත සඳහන් පද්ධති සහ පාලන ක්ෂේත්‍රයන් සම්බන්ධයෙන් සභාවේ විශේෂ අවධානය යොමු විය යුතුය.

i. ආදායම් රැස්කිරිම
ii. ස්ථාවර වත්කම්
iii. ගිණුම්කරණය
iv. කාර්ය මණ්ඩලය
v. පරිත්‍යාග
vi. විවිධ තැන්පතු
vii. අයවැය ලේඛනය
viii. ගබඩා